# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 08 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1988 නොවැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.05 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 59/88

**ඇතැම් පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ඇතැම් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් සඳහා නාම යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද:

මහජන සාමය පිළිබඳ හේතූන් නිසා ඒ ඡන්ද විමසීම්වල දී ඡන්දය දීම කල් දැමීම අවශ්‍ය වූ හෙයින් ද:

එකී පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම සහ එකී පළාත් පාලන ප්‍රදේශවල පළාත් පාලන කටයුතු නොකඩවා කරගෙන යාම සඳහා වැඩිදුර විධිවිධාන සැලැස්වීම පිණිස 1987 අංක 43 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් විධිවිධාන සලස්වා ඇති හෙයින් ද:

තවද මේ පළාත් පාලන ආයතනවල ධුර කාලය තවදුරටත් දීර්ඝ කිරීම දැන් අවශ්‍ය වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** (1) මේ පනත 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)*

(2) මේ පනතේ විධිවිධාන, එහි 5 වන වගන්තියේ විධිවිධාන හැර මේ පනත ආරම්භ වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

**2.** මේ පනතේ 1 වන උපලේඛනයේ සඳහන් සෑම සංවර්ධන සභාවකටම තෝරා පත් කර ගනු ලැබ 1989 ජනවාරි මස පළමුවන දිනට පෙරාතුව ම වූ දින ධුරය දරන සාමාජිකයන්ගේ ධුර කාලය, 1989 ජනවාරි මස පළමුවන දිනයේ සිට 1990 ජනවාරි මස පළමුවන දින තෙක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කලින් දිනයක් තෙක් හෝ මෙයින් දීර්ඝ කරනු ලැබේ. *(සංවර්ධන සභාවල සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම.)*

**3.** (1) මහ නගර සභා ආඥාපනතේ 10 වන වගන්තියේ හෝ ඒ වගන්තිය යටතේ සාදන ලදුව 1987 මැයි මස 12 වන දින අංක 453/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ හෝ කුමක් සඳහන් වුව ද, 1989 ජනවාරි මස පළමුවන දිනට පෙරාතුව ම වූ දින ධුරය දරන, මේ පනතේ II වන උපලේඛනයේ සඳහන් එක් එක් මහ නගර සභාවේ සභිකයන්ගේ ධුර කාලය, 1989 ජනවාරි මස පළමුවන දින පටන් 1990 ජනවාරි මස පළමුවන දින තෙක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා *(ඇතැම් මහ නගර සභාවල සහ නගර සභාවල සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම.)*

විසින් නියම කරනු ලැබිය හැකි යම් කලින් දිනයක් තෙක් හෝ මෙයින් දීර්ඝ කරනු ලැබේ. තවද, එකී ජනවාරි මස පළමුවන දිනය හෝ එසේ නියම කරනු ලැබූ දිනය මහ නගර සභා ආඥාපනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, ඒ එක් එක් සභාවට තෝරා පත් කරනු ලබන අලුත් සභික යන්ගේ ධුර කාලය ආරම්භ වන දිනය වන්නේය.

(2) නගර සභා ආඥාපනතේ 10 වන වගන්තියේ හෝ ඒ වගන්තිය යටතේ සාදන ලදුව 1987 මැයි මස 12 වන දින අංක 453/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ හෝ කුමක් සඳහන් වුව ද 1989 ජනවාරි මස පළමුවන දිනට පෙරාතුව ම වූ දින ධුරය දරන, මේ පනතේ III වන උපලේඛනයේ සඳහන් එක් එක් නගර සභාවේ සභිකයන්ගේ ධුර කාලය, 1989 ජනවාරි මස පළමුවන දින පටන් 1990 ජනවාරි මස පළමුවන දින තෙක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කලින් දිනයක් තෙක් හෝ මෙයින් දීර්ඝ කරනු ලැබේ. තවද, එකී ජනවාරි මස පළමුවන දිනය හෝ එසේ නියම කරනු ලැබූ දිනය නගර සභා ආඥාපනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, ඒ එක් එක් සභාවට තෝරා පත් කරනු ලබන අලුත් සභිකයන්ගේ ධුර කාලය ආරම්භ වන දිනය වන්නේ ය.

ඇතැම් ප්‍රාදේශීය සභාවල කටයුතු විශේෂ කොමසාරිස්වරයන් විසින් පරිපාලනය කරනු ලැබීම.

4. (1) 1987 මැයි මස 12 වන දින අංක 453/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 6 වන වගන්තිය යටතේ කරන ලද නියමයෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ IV වන උපලේඛනයෙහි සහ V වන උපලේඛනයෙහි සඳහන් සෑම ප්‍රාදේශීය සභාවකම ධුර කාලය, 1990 ජනවාරි මස පළමුවන දිනයෙහි හෝ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කලින් දිනයක හෝ ආරම්භ විය යුතුය ; තව ද ඒ ජනවාරි මස පළමුවන දිනය හෝ එසේ නියම කරන ලද දිනය හෝ, ඒ එක් එක් සභාවේ ධුර කාලය ආරම්භ වන දිනය ලෙස එම පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, එම දිනය එම නියමයේ නිශ්චිත පරිදි 1989 ජනවාරි මස පළමුවන දිනය නොවන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, 1989 ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භව, ((1) වන උප වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි) මේ පනතෙහි IV වන උපලේඛනයෙහි හෝ V වන උපලේඛනයෙහි සඳහන් යම් ප්‍රාදේශීය සභාවක ධුර කාලය ආරම්භ වීමේ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ඒ සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහාත් එම කාර්යය සඳහා සහ එම නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ, ප්‍රාදේශීය සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයාගේ හෝ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටුකිරීම සඳහාත්, විශේෂ කොමසාරිස්වරයකු පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද මේ පනතේ IV වන උපලේඛනයේ හෝ V වන උපලේඛනයේ හෝ නිශ්චය කොට දැක්වෙන ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය කිරීම සඳහා 1987 අංක 43 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ, පත් කරන ලදුව 1988 දෙසැම්බර් මස 31 වන දින දී ධුරය දරන විශේෂ කොමසාරිස්වරයකු, 1989 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, ඒ සභාවේ ධුර කාලය ආරම්භ වීමේ දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ තවදුරටත් ඒ ප්‍රාදේශීය සභාවේ කටයුතු පරිපාලනය කරගෙන යා යුතු අතර, ඒ කාර්යය සඳහා සහ ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රාදේශීය සභාවක හෝ ප්‍රාදේශීය සභා සභාපතිවරයකුගේ හෝ බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය ඉටු කිරීම ද කරගෙන යා යුතු ය.

(3) මේ පනතේ IV වන උපලේඛනයෙහි හෝ V වන උපලේඛනයේ හෝ සඳහන් ප්‍රාදේශීය සභාවක ධුර කාලය ආරම්භ වූ විට ඒ ප්‍රාදේශීය සභාව (1) වන උපවගන්තිය යටතේ ඒ ප්‍රාදේශීය සභාවෙහි කටයුතු පරිපාලනය කිරීමට පත් කරන ලද යම් විශේෂ කොමසාරිස්වරයකුගේ අනුප්‍රාප්තිකයා විය යුතු ය.

ඇතැම් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් සඳහා වූ නාම යෝජනා වලට අදාළ විශේෂ විධිවිධාන.

5. (1) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 35 වන වගන්තියේ හෝ ඒ වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමක හෝ කුමක් සඳහන් වුව ද, යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ නිශ්චිතව සඳහන් කළ කලින් වූ නාම යෝජනා කාලසීමාවක් තුළ දී නාමයෝජනා පත්‍ර කිසිවක් නොලැබුණු ඡන්ද විමසීම් ප්‍රදේශයක් හෝ ලැබුණු සියලු නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද විමසීම් ප්‍රදේශයක් වන, මේ පනතේ V වන උපලේඛනයේ සඳහන් එක් එක් ඡන්ද විමසීම් ප්‍රදේශ සඳහා, ඒ ඒ තේරීම් භාර නිලධරයන් විසින් නාමයෝජනා භාර ගන්නා කාලසීමාව සඳහන් කරන්නා වූ දැන්වීමක්, මේ වගන්තිය ක්‍රියාත්මක වන දින සිට සති දෙකක් ඇතුළත දී, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් කාලසීමාව තුළ, එවැනි යම් ඡන්ද විමසීම් ප්‍රදේශ සම්බන්ධයෙන් නාමයෝජනා පත්‍ර කිසිවක් තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන ඉන්පසු අදාළ විය යුතු ය. අනෙක් අතට, යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාමයෝජනා පත්‍ර කිසිවක් ඒ කාලසීමාව තුළ දී නොලැබී ඇත්තා වූ හෝ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ඒ කාලසීමාව ඇතුළත ලැබුණු සියලු නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරන ලද්දා වූ හෝ අවස්ථාවක, ඒ ආඥාපනතේ 35 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති වල විධිවිධාන අදාළ විය යුතු ය.

3—ඩී 000934 (88/09)

## I වන උපලේඛනය (2 වන වගන්තිය)

### සභිකයින්ගේ ධුර කාලය දීර්ඝ කර ඇති සංවර්ධන සභා

1. කොළඹ සංවර්ධන සභාව
2. ගම්පහ සංවර්ධන සභාව
3. කළුතර සංවර්ධන සභාව
4. මහනුවර සංවර්ධන සභාව
5. මාතලේ සංවර්ධන සභාව
6. නුවරඑළිය සංවර්ධන සභාව
7. ගාල්ල සංවර්ධන සභාව
8. මාතර සංවර්ධන සභාව
9. හම්බන්තොට සංවර්ධන සභාව
10. අම්පාර සංවර්ධන සභාව
11. කුරුණෑගල සංවර්ධන සභාව
12. පුත්තලම සංවර්ධන සභාව
13. අනුරාධපුර සංවර්ධන සභාව
14. පොළොන්නරුව සංවර්ධන සභාව
15. බදුල්ල සංවර්ධන සභාව
16. මොණරාගල සංවර්ධන සභාව
17. රත්නපුර සංවර්ධන සභාව
18. කෑගල්ල සංවර්ධන සභාව

## II වන උපලේඛනය (3 වන වගන්තිය)

### සභිකයින්ගේ ධුර කාලය දීර්ඝ කර ඇති මහ නගර සභා

1. කොළඹ මහ නගර සභාව
2. දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව
3. මීගමුව මහ නගර සභාව
4. මහනුවර මහ නගර සභාව
5. ගාල්ල මහ නගර සභාව
6. කුරුණෑගල මහ නගර සභාව
7. බදුල්ල මහ නගර සභාව
8. රත්නපුර මහ නගර සභාව.

## III වන උපලේඛනය (3 වන වගන්තිය)

### සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කර ඇති නගර සභා

1. සීතාවකපුර නගර සභාව
2. කොලොන්නාව නගර සභාව
3. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව
4. මොරටුව නගර සභාව
5. ගම්පහ නගර සභාව
6. ජා-ඇල නගර සභාව
7. කටුනායක-සීදුව නගර සභාව
8. මිනුවන්ගොඩ නගර සභාව
9. පෑලියගොඩ නගර සභාව
10. බේරුවල නගර සභාව

11. හොරණ නගර සභාව
12. කළුතර නගර සභාව
13. පානදුර නගර සභාව
14. ගම්පොළ නගර සභාව
15. කඩුගන්නාව නගර සභාව
16. නාවලපිටිය නගර සභාව
17. වත්තේගම නගර සභාව
18. හැටන්-දික්ඔය නගර සභාව
19. තලවාකැලේ-ලිඳුල නගර සභාව
20. අම්බලන්ගොඩ නගර සභාව
21. මාතර නගර සභාව
22. හම්බන්තොට නගර සභාව
23. තංගල්ල නගර සභාව
24. අම්පාර නගර සභාව
25. හලාවත නගර සභාව
26. පුත්තලම නගර සභාව
27. අනුරාධපුර නගර සභාව
28. බණ්ඩාරවෙල නගර සභාව
29. හපුතලේ නගර සභාව
30. කෑගල්ල නගර සභාව

## IV වන උපලේඛනය (4 වන වගන්තිය)

සභිකයන්ගේ ධුර කාලය ආරම්භ වීම කල් දමා ඇති ප්‍රාදේශීය සභා

1. හෝමාගම ප්‍රාදේශීය සභාව
2. කඩුවෙල ප්‍රාදේශීය සභාව
3. කැස්බෑව ප්‍රාදේශීය සභාව
4. කොට්ටාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
5. මහරගම ප්‍රාදේශීය සභාව
6. සීතාවක ප්‍රාදේශීය සභාව
7. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
8. දිවුලපිටිය ප්‍රාදේශීය සභාව
9. දොම්පේ ප්‍රාදේශීය සභාව
10. ගම්පහ ප්‍රාදේශීය සභාව
11. ජා-ඇල ප්‍රාදේශීය සභාව
12. කටාන ප්‍රාදේශීය සභාව
13. කැලණිය ප්‍රාදේශීය සභාව
14. මහර ප්‍රාදේශීය සභාව
15. මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව
16. මීරිගම ප්‍රාදේශීය සභාව
17. අගලවත්ත ප්‍රාදේශීය සභාව.
18. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව
19. බේරුවල ප්‍රාදේශීය සභාව
20. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව
21. දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

22. හොරණ ප්‍රාදේශීය සභාව
23. කළුතර ප්‍රාදේශීය සභාව
24. මතුගම ප්‍රාදේශීය සභාව
25. පානදුර ප්‍රාදේශීය සභාව
26. වලල්ලාවිට ප්‍රාදේශීය සභාව
27. අකුරණ ප්‍රාදේශීය සභාව
28. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව
29. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව
30. මහනුවර කඩවත් සතර සහ ගඟ වට කෝරළේ ප්‍රාදේශීය සභාව
31. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව
32. මිනිපේ ප්‍රාදේශීය සභාව
33. පන්විල ප්‍රාදේශීය සභාව
34. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
35. පාතදුම්බර ප්‍රාදේශීය සභාව
36. පාතහේවාහැට ප්‍රාදේශීය සභාව
37. පූජාපිටිය ප්‍රාදේශීය සභාව
38. උඩදුම්බර ප්‍රාදේශීය සභාව
39. උඩපළාත ප්‍රාදේශීය සභාව
40. යටිනුවර ප්‍රාදේශීය සභාව
41. දඹුල්ල ප්‍රාදේශීය සභාව
42. ගලේවෙල ප්‍රාදේශීය සභාව.
43. නාඋල ප්‍රාදේශීය සභාව
44. පල්ලෙපොල ප්‍රාදේශීය සභාව
45. රත්තොට ප්‍රාදේශීය සභාව
46. යටවත්ත ප්‍රාදේශීය සභාව
47. හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව
48. කොත්මලේ ප්‍රාදේශීය සභාව
49. වලපනේ ප්‍රාදේශීය සභාව
50. අක්මීමන ප්‍රාදේශීය සභාව
51. අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව
52. බද්දේගම ප්‍රාදේශීය සභාව
53. බලපිටිය ප්‍රාදේශීය සභාව
54. බෙන්තොට ප්‍රාදේශීය සභාව
55. ඇල්පිටිය ප්‍රාදේශීය සභාව
56. හබරාදූව ප්‍රාදේශීය සභාව
57. හික්කඩුව ප්‍රාදේශීය සභාව
58. කරන්දෙණිය ප්‍රාදේශීය සභාව
59. ලබුදූව ප්‍රාදේශීය සභාව
60. නාගොඩ ප්‍රාදේශීය සභාව
61. නෙලුව ප්‍රාදේශීය සභාව
62. නියාගම ප්‍රාදේශීය සභාව
63. තවලම ප්‍රාදේශීය සභාව
64. යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව
65. අකුරැස්ස ප්‍රාදේශීය සභාව
66. දෙවිනුවර ප්‍රාදේශීය සභාව

67. **දික්වැල්ල ප්‍රාදේශීය සභාව**
68. හක්මන ප්‍රාදේශීය සභාව
69. **කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**
70. **කොටපොල ප්‍රාදේශීය සභාව**
71. මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
72. පස්ගොඩ ප්‍රාදේශීය සභාව
73. තිහගොඩ ප්‍රාදේශීය සභාව
74. වැලිගම ප්‍රාදේශීය සභාව
75. අම්බලන්තොට ප්‍රාදේශීය සභාව
76. බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව
77. හම්බන්තොට ප්‍රාදේශීය සභාව
78. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව
79. තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාව
80. වීරකැටිය ප්‍රාදේශීය සභාව
81. වව්නියාව දකුණ (සිංහල) ප්‍රාදේශීය සභාව
82. කට්ටන්කුඩි ප්‍රාදේශීය සභාව
83. අද්දලච්චේනායි ප්‍රාදේශීය සභාව
84. **දමන ප්‍රාදේශීය සභාව**
85. කල්මුනේ ප්‍රාදේශීය සභාව
86. කරුන්කොඩිතිව් ප්‍රාදේශීය සභාව
87. නින්දාවුර්පත්තු ප්‍රාදේශීය සභාව
88. පොතුවිල් ප්‍රාදේශීය සභාව
89. **සමන්තුරේ ප්‍රාදේශීය සභාව**
90. කන්තලේ ප්‍රාදේශීය සභාව
91. කින්නියා ප්‍රාදේශීය සභාව
92. මුතූර් ප්‍රාදේශීය සභාව
93. අලව්ව ප්‍රාදේශීය සභාව
94. බිංගිරිය ප්‍රාදේශීය සභාව
95. ගල්ගමුව ප්‍රාදේශීය සභාව
96. ගිරිබාව ප්‍රාදේශීය සභාව
97. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව
98. කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව
99. කුරුණෑගල ප්‍රාදේශීය සභාව
100. මහව ප්‍රාදේශීය සභාව
101. නිකවැරටිය ප්‍රාදේශීය සභාව
102. පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
103. රිදීගම ප්‍රාදේශීය සභාව
104. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව
105. හලාවත ප්‍රාදේශීය සභාව
106. කල්පිටිය ප්‍රාදේශීය සභාව
107. නවගත්තේගම ප්‍රාදේශීය සභාව
108. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව
109. ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාව

110. හොරොව්පතාන ප්‍රාදේශීය සභාව
111. කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව
112. කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව
113. මැදවච්චිය ප්‍රාදේශීය සභාව
114. මිහින්තලේ ප්‍රාදේශීය සභාව
115. නොච්චියාගම ප්‍රාදේශීය සභාව
116. නුවරගම්පළාත (මධ්‍යම) ප්‍රාදේශීය සභාව
117. නුවරගම්පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය සභාව
118. රඹෑව ප්‍රාදේශීය සභාව
119. තිරප්පනේ ප්‍රාදේශීය සභාව
120. දිඹුලාගල ප්‍රාදේශීය සභාව
121. හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව
122. ලංකාපුර ප්‍රාදේශීය සභාව
123. තමන්කඩුව ප්‍රාදේශීය සභාව
124. බුත්තල ප්‍රාදේශීය සභාව
125. ඇල්ල ප්‍රාදේශීය සභාව
126. හාලි—ඇල ප්‍රාදේශීය සභාව
127. මහියංගන ප්‍රාදේශීය සභාව
128. පස්සර ප්‍රාදේශීය සභාව
129. රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව
130. සොරනාතොට ප්‍රාදේශීය සභාව
131. ඌව—පරණගම ප්‍රාදේශීය සභාව
132. වැලිමඩ ප්‍රාදේශීය සභාව
133. බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව
134. බුත්තල ප්‍රාදේශීය සභාව
135. මොණරාගල ප්‍රාදේශීය සභාව
136. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
137. තනමල්විල ප්‍රාදේශීය සභාව
138. අයගම ප්‍රාදේශීය සභාව
139. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
140. කලවාන ප්‍රාදේශීය සභාව
141. කුරුවිට ප්‍රාදේශීය සභාව
142. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
143. රත්නපුර ප්‍රාදේශීය සභාව
144. අරණයක ප්‍රාදේශීය සභාව
145. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව
146. දැරණියගල ප්‍රාදේශීය සභාව
147. ගලිගොමුව ප්‍රාදේශීය සභාව

148. කෑගල්ල ප්‍රාදේශීය සභාව
149. මාවනැල්ල ප්‍රාදේශීය සභාව
150. රඹුක්කන ප්‍රාදේශීය සභාව
151. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
152. වරකාපොල ප්‍රාදේශීය සභාව
153. යටියන්තොට ප්‍රාදේශීය සභාව

## V වන උපලේඛනය (5 වන වගන්තිය)

### නාමයෝජනා ලැබී නොමැති පළාත් පාලන ආයතන

1. යාපනය මහ නගර සභාව
2. මඩකලපුව මහ නගර සභාව
3. වැල්වැටිතුරේ නගර සභාව
4. පේදුරුතුඩුව නගර සභාව
5. චාවකච්චේරිය නගර සභාව
6. වව්නියාව නගර සභාව
7. චාවකච්චේරි ප්‍රාදේශීය සභාව
8. ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව
9. කයිට්ස් ප්‍රාදේශීය සභාව
10. නල්ලූර් ප්‍රාදේශීය සභාව
11. පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව
12. වඩමාරච්චි (නිරිත) ප්‍රාදේශීය සභාව
13. වලිකාමම් (නැගෙනහිර) ප්‍රාදේශීය සභාව
14. වලිකාමම් (උතුර) ප්‍රාදේශීය සභාව
15. වලිකාමම් (දකුණ) ප්‍රාදේශීය සභාව
16. වලිකාමම් (නිරිත) ප්‍රාදේශීය සභාව
17. වලිකාමම් (බටහිර) ප්‍රාදේශීය සභාව
18. වේලනයි ප්‍රාදේශීය සභාව
19. කරච්චි ප්‍රාදේශීය සභාව
20. පච්චිලපල්ලි ප්‍රාදේශීය සභාව
21. පූනකරි ප්‍රාදේශීය සභාව
22. මන්නාරම ප්‍රාදේශීය සභාව
23. මාන්තයි (බටහිර) ප්‍රාදේශීය සභාව
24. මුසාලෙයි ප්‍රාදේශීය සභාව
25. නානාට්ටාන් ප්‍රාදේශීය සභාව
26. වව්නියා (උතුර) ප්‍රාදේශීය සභාව
27. වව්නියා (දකුණ-දෙමළ) ප්‍රාදේශීය සභාව
28. වෙන්කලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව
29. මාන්තයි (නැගෙනහිර) ප්‍රාදේශීය සභාව
30. මැරිටයිම් පත්තු ප්‍රාදේශීය සභාව
31. පුතුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව
32. තුනුක්කායි ප්‍රාදේශීය සභාව
33. එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාව
34. කෝරලෙයි පත්තු (උතුර) ප්‍රාදේශීය සභාව
35. මන්මුනයි (නිරිත) ප්‍රාදේශීය සභාව.

36. මන්මුනායි (දකුණ) සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව

37. මන්මුනායි (බටහිර) ප්‍රාදේශීය සභාව

38. මන්මුනායි ප්‍රාදේශීය සභාව

39. පෝරතිව් පත්තු ප්‍රාදේශීය සභාව

40 ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව

41. තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව

42. කුච්චවෙලි ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 236 යි, කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.